# තොරතුරු වලට ප්‍රවේශ වීමේ පටිපාටිය

**පනත** : 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පණත

**නියෝග** : 2017 පෙබරවාරි 3 දිනැති අංක 2004/66 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය

**රාජ්‍ය බලධාරියා** : ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

**පනත සහ නියෝග** : පහත සබැඳියෙන් බා ගතකළ හැකිය www.documents.gov.lk

උක්ත පනත යටතේ රාජ්‍ය පරිපාලන, පලාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශයට අදාල තොරතුරු ලබාගැනීම පිණිස පනතේ සඳහන් තොරතුරු නිලධාරියා හට RTI 1 දරණ අයදුම්පත භාවිතා කරමින් තොරතුරු ලබාගැනීම පිණිස වන ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. එහෙත් මේ අයදුම් පත ඉදිරිපත් කිරීම අනිවාර්ය නැත.

**තොරතුරු නිලධාරී**

| | |
|---|---|
| **නම** | : එච්.එම්.එස්.පී.තිසේරා මහත්මිය |
| **තනතුර** | : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) |
| **ලිපිනය** | : ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය<br>28/10, මලලසේකර මාවත, කොළඹ 07 |
| **දුරකථන** | : +94 115980222 (දිගුව - 222) |
| **ෆැක්ස් අංකය** | : +94 112553806 |
| **වි. තැපැල** | : adgaf@slida.gov.lk |

**තොරතුරු ලබාගැනීම පිණිස අයදුම් කිරීම**

1. අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා RTI 1 දරණ අයදුම්පත, ලිපියක් හෝ වාචික ඉල්ලීමක් තොරතුරු නිලධාරී හට ඉදිරිපත් කර එය ලද බවට පිලිතුරක් ලබාගන්න.
2. ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු ලබාදිය හැකි/නොහැකි බව හැකි තරම් ඉක්මනින් නැතිනම් දින දහහතරක් තුළ එසේ ඔබට දැනුම් දෙනු ඇත.
3. ඉල්ලා ඇති තොරතුරු නිකුත් කිරීමට තීරණය කරනු ලබනා අවස්ථාවලදී යම් ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ නම් කොමිසම විසින් නියම කර ඇති අදාල ගාස්තුව ඔබට දැනුම් දෙනු ඇත. නියම කර ඇති ගාස්තු ගෙවීම මත හෝ එවන් ගාස්තුවක් නැති නම් නොමිලේ දින දහහතරක් තුළ ඔබට ඉල්ලා ඇති තොරතුරු සපයනු ඇති අතර යම් හෙයකින් ගෙවීම් කල පසුව අදාල තොරතුරු දින දහහතරක් තුළ ලබාදීම අසීරු නම් තොරතුරු නිලධාරී ඔබට කාලය දීර්ඝ කිරීමට හේතු දන්වමින් අතිරේක දින 21ක් නොඉක්මවන කාලයක් තුළ ඔබට තොරතුරු ලබාදෙනු ඇත.
4. ඉල්ලා ඇති තොරතුරු කිසියම් පුද්ගලයෙකුගේ ජීවිතයට හෝ පුද්ගලිකත්වයට සම්බන්ධ වන කල්හී ඉල්ලීම සිදුකර පැය හතලිස් අටක් තුළ ඊට ප්‍රතිචාර දැක්විය යුතුය.
5. ඔබ විසින් ඉල්ලන ලද තොරතුරු සම්බන්ධයෙන් ඔබට ලැබෙනා පහත ප්‍රතිචාර සම්බන්ධයෙන් ඔබ තෘප්තිමත් නොවන්නේ නම් දින දහහතරක් තුළ පහත නම් කර ඇති නිලධාරී හට අභයාචනයක් ඉදිරිපත් කිරීමට කාරුණික වන්න.

6.

1. තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම
2. 5 වන වගන්තිය යටතේ ලබාදීමෙන් වැලකී සිටිය හැකි තොරතුරක් යන පදනම මත තොරතුරු සඳහා ප්‍රවේශය ප්‍රත්ක්ෂේප කිරීම.
3. පණත මගින් දක්වා ඇති කාල රාමුවට අනුගත නොවීම.
4. අසම්පූර්ණ, නොමගයවනසුළු හෝ ව්‍යාජ තොරතුරු ලබාදීම.
5. අධික ගාස්තු අයකිරීම.
6. ඉල්ලා ඇති ආකාරයෙන් තොරතුරු සැපයීම තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම .
7. තමන් විසින් ඉල්ලා සිටින ලද තොරතුරු වෙත පිවිසුම වලක්වාලනු පිණිස ඒවා විකෘති කර, විනාශ කර, හෝ අස්ථානගත කර ඇතැයි ඉල්ලීම ඉදිරිපත් කරනා පුරවැසියා හට විශ්වාස කිරීමට සාධාරණ පදනමක් ඇති අවස්ථාවලදී.

**නම් කරන ලබනා නිලධාරී**


**නම** : ඒ.වී.ජනාදර මහතා

**තනතුර** : අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

**ලිපිනය** : ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
28/10, මලලසේකර මාවත, කොළඹ 07.

**දුරකථන අංක** : +94 11 5980202 (Ext - 202)

**වි. තැපැල** : dg@slida.gov.lk